# ගහකොළ සුරකිමු

වන සිව්පා දිය උල්පත් වැනසෙද්        දී
හිරු දෙව්රද මතු පරපුර මිරිකද්        දී
අප සුරකින මිහිකත කතරක් වෙද්        දී
වන වනසතු කිම ජාතිය නැතිවෙද්        දී

පෙර පරපුරෙන් ලද තුරුලිය දායා        ද
මතු පරපුරට රැකදෙනු යුතු කමවේ        ද
ධන සම්පතට ලොබ කොට එය නැසුවේ        ද
මිහිකත මියෙනු බව ඔබහට නොපෙනේ        ද



ජල පස වායු සම්පත් නිති රැක දෙමි        න
ජීවය සැමට සලසයි මිළ නොගනිමි        න
වනයා තුරුලතා මරු මෙහි කැඳවමි        න
මිහිකත නොහඬවනු තුරුලිය වනසමි        න

සූර්ය දෙවිඳු ලොව හැම වැඩ සලසන        වා
ශක්තිය බලය නිති සැමහට සලසන        වා
ගහ කොළ වැනසුවොත් ඔහු අධිබල වෙන        වා
ජල පස වායු සම්පත් ඉන් වැනසෙන        වා

අඟුරුවායු ($CO_2$) පෙරමින් පන රැක දෙන්        නේ
මහමග යනෙන දනටත් සිසිලස දෙන්        නේ
සිදබිඳ දමන අයටත් සෙවනක් වෙන්        නේ
එවන් ගසුයි මිනිසුන් අහො සිඳලන්        නේ

කොබෝ නිල ගස සිටවීමේ පින        ට
පරසතු මදාරා රුක් ලැබුනලු සතු        ට
අනිමිස ලෝවනෙන් මුණිඳුද ලබන්න        ට
ගසකට මිසක හැකිවෙද එය මිනිසුන්        ට

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
ව්‍යාප්ති හා සංනිවේදන මධ්‍යස්ථානයේ
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ
රාජකරුණා දොළවීර විසිනි.